# 10 සිංහරාජයට චාරිකාවක්



සිංහරාජ වනාන්තරය පහත රට තෙත් කලාපයේ පිහිටා ඇත. එය ගාල්ල, මාතර හා රත්නපුර දිස්ත්‍රික්කවලට අයත් ය.

සිංහරාජයට රත්නපුර, කලවාන, කුඩම පැත්තෙන් එන්න පාරක් හා දෙණියාය පැත්තෙන් එන්න පාරක් තියෙනවා. මේ පාරවල් කොයිකෙන් හරි මේ වනාන්තරය බලන්න යන්න පුළුවන්.

සිංහරාජ වනාන්තරය හරි ම ලස්සනයි. මේ වනාන්තරයේ ජලයේ වැවෙන කුඩා පැළෑටි, තණ වර්ග, වැල්, කටු පඳුරු බහුලයි. ඒ වගේ ම ලොකුවට වැඩුණ ගසුත් වැලුත්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

තියෙනවා. හොර, කීණ, බැදි දෙල් වගේ ගස් වර්ග හුඟක් මෙහි තියෙනවා. සමහර ගස් මීටර් පනහකටත් වඩා උසයි.

ඒවගේ ම එක එක වර්ගයේ දුර්ලභ පැළෑටි වර්ග මෙහි තියෙනවා. මිනිසාට ඕන කරන පලතුරු වර්ග, මල් වර්ග, බෙහෙත් පැළෑටි වර්ග ඕන තරම් මෙහි තියෙනවා.

මේ කොයි පැළෑටියෙන් උනත් හුඟක් ප්‍රයෝජන තියෙනවා. පිරිසිදු වාතය, ආහාර, බෙහෙත් මේ ශාකවලින් ලැබෙනවා.



මේ ගස් වැල් කවුරුවත් වවාපු ඒවා නෙමෙ යි. ඉබේම හැදුණු ඒවායි. මේ වනාන්තරය ස්වාභාවික වනාන්තරයක් කියන්නේ ඒ නිසයි.

සිංහරාජයේ විවිධ වර්ගයේ සත්තු ඉන්නවා. ප්‍රමාණයෙන් කුඩා සත්තුත් ඉන්නවා. විශාල සත්තුත් ඉන්නවා. දම්පාට මුහුණක් තියෙන වඳුරෝ, වැඳිරියෝ



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මෙහි ජීවත් වෙනවා. දිවියො, මී මින්නො, බුරන මුවන්, මුව දෙන්නු ආදීනුත් මෙහි ඉන්නවා. සතුන් විතරක් නෙමෙයි, දුර්ලභ ගණයේ විවිධ කුරුලු වර්ගත් මෙහි ජීවත් වෙනවා. නයි පොළොංගු වගේ උරග වර්ගයට අයත් විෂ සත්තුත් මෙහි ඉන්නවා.



ඒ සතුන්ට ආහාර මේ වනාන්තරයෙන් ම සැපයෙනවා. උන් ඒ කෑම කකා එහෙ මෙහෙ දුවදුවා සතුටින් ජීවත් වෙනවා. විවිධ ශබ්ද කරකර එකිනෙකා කතා කර ගන්නවා.

ඒ නිසා අපි මේ වනාන්තරයේ ලස්සන බලන්න එහි යන්න ඕනෑ. මේ වනාන්තරයේ වටිනාකම, ලස්සන පේන්නේ අපි ඒකට ඇතුළු වෙලා බැලුවාමයි.

සිංහරාජයට නගින්න මාවත් කිහිපයක් තියෙනවා. කොයිකෙන් හරි කන්දට නගින්න පුළුවන්. මේ ගමනේ දී ගහ කොළ කොයිකටවත් හානි කරන්න හොඳ නෑ. කොච්චර ලස්සන මල්, කෘමීන් හමු උනත් ඒවා අරන් එන්න හොඳ නෑ. කොයි දේත් සිංහරාජයේ ම ආරක්ෂා වෙන්න ඕනෑ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සමහරුන් නම් කොහොම හරි පැළෑටි අරන් එනවා. මෙහෙම කරන එක ජාතික අපරාධයක්. ඔක්කොම එහෙම කළොත් මේ වනාන්තරය වැනසේවි. මේ වනාන්තරය කොච්චර වටිනා ජාතික උරුමයක් ද? එය රැක ගන්න එක ශ්‍රී ලාංකික අපේ ජාතික වගකීමක්, යුතුකමක්. අපි කොහොම හරි ඒ යුතුකම ඉටු කරන්න එකතු වෙමු; පෙළ ගැහෙමු.

## ක්‍රියාකාරකම 1

(i) මේ පාඩම ශබ්ද නගා කියවන්න.

(ii) සිංහරාජ වනාන්තරයේ අපට දකින්න තියෙන්නේ මොනවා ද යි කියන්න.

(iii) සිංහරාජය ගැන ඔබ දන්නා තවත් කරුණු පන්තිය ඉදිරියේ කියන්න.

## ක්‍රියාකාරකම 2

පහත දක්වෙන වැකි කියවන්න.

"විවිධ ශබ්ද **කරකර** කතා කර ගන්නවා."

මෙහි තද කළු අකුරෙන් ඇති ක්‍රියාපදය දෙස බලන්න.

එහි තේරුම විමසා දැන ගන්න.

(i) එවැනි තවත් ක්‍රියාපද පාඩමේ තිබෙනවා ද යි සොයා කියන්න.

(ii) පහත දැක්වෙන වාක්‍ය ඔබේ අභ්‍යාස පොතේ පිටපත් කර ගන්න. එම වාක්‍යවල ඇති ඉහත දැක්වෙන ආකාරයේ ක්‍රියා පද යටින් ඉරි අඳින්න.

(i) ගුරුතුමිය පොත් බලබලා හිටියා.

(ii) මම කෑම කකා හිටියා.

(iii) සත්තු කැලේ දුවදුවා ඉන්නවා.

(iv) කුරුල්ලෝ නාද කරකර ඉන්නවා.

(v) බල්ලා බුරබුරා දිවුවා.

## ක්‍රියාකාරකම 3

මුහුණ දම්පාට **වඳුරෝ, වැඳිරියෝ** ජීවත් වෙනවා. මෙහි තද කළු අකුරින් ඇති පදවලින් පිරිමි සත්තුත් ගැහැනු සත්තුත් ගැන කියැවෙනවා.

පිරිමි ගැන කියැවෙන පදවලට පුරුෂලිංග පද කියාත් ගැහැනු ගැන කියැවෙන පදවලට ස්ත්‍රීලිංග පද කියාත් කියනවා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(i) පාඩමේ ඇති ස්ත්‍රීලිංග පද හා පුරුෂලිංග පද සොයා කියන්න.

(ii) ඔබේ පවුලේ සිටින ඥාතීන් හඳුන්වන නම් පහත සඳහන් කොටුවේ ගොනු කරන්න.

| පුරුෂලිංග පද | ස්ත්‍රීලිංග පද |
|---|---|
| | |

## ක්‍රියාකාරකම 4

පහත සඳහන් ආකාරයේ කොටුවක් අභ්‍යාස පොතේ ඇඳ ඔබේ වටපිටාවේ ජීවත්වන සතුන්ගේ නම් වෙන වෙනම ලියා දක්වන්න.

| පිරිමි සතුන් | ගැහැනු සතුන් |
|---|---|
| | |

## ක්‍රියාකාරකම 5

පහත දී ඇති වගුව අභ්‍යාස පොතේ පිටපත් කරගන්න. එහි ඇති උදාහරණ සැලකිල්ලට ගෙන පහත 'අ' කොටුවේ තිබෙන පුරුෂලිංග පදයට ගැළපෙන ස්ත්‍රීලිංග පදය 'ආ' කොටුවේ ලියන්න.

| අ | ආ |
|---|---|
| බල්ලා | බැල්ලී |
| බළලා | ............ |
| සතුරා | ............ |
| කුරුල්ලා | කිරිල්ලී |
| ගිරවා | ගිරවී |
| රිළවා | ............. |
| තාරාවා | ............. |
| සුද්දා | සුද්දි |
| වැද්දා | ............. |
| කටුස්සා | ............. |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 6

- මේ පාරවල් **කොයිකෙන්** හරි මේ වනාන්තරය බලන්න යන්න පුළුවන්.
- **කොයිකට** උනත් අපි මේ වනාන්තරයේ ලස්සන බලන්න එහි යන්න ඕන.

මේ වැකි දෙකේ කළු කර ඇති වචන බලන්න. ඒවායේ තේරුම විමසා දැන ගන්න.